රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 58/89

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1989 නොවැම්බර් මස 30 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරු
සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## රජයේ කාර්යාලවල පැමිණීම.

ඔබේ අධීක්ෂණය යටතේ පවත්නා ආයතනයන්හි නියුතු කාර්ය මණ්ඩලවල පැමිණීම සහ වැඩවල නිරත වන කාලය සම්බන්ධව පවත්නා දුර්වලතා මඟ හරවා ගැනීමට ඔබ විසින් ක්ෂණික පිළියම් යෙදිය යුතු බවට රජය තීරණය කර ඇත. රජයේ කාර්යාලයන්හි පැමිණීම, විශේෂයෙන්ම වැඩ කාල වලදී අතිශයින්ම අසතුටුදායක බව පෙනේ. ප්‍රමාද වී පැමිණීම සහ වේලාසනින් පිටවී යෑම එදිනෙදා සාමාන්‍ය දෙයක් බව ද දක්නට තිබේ. සති ගණනාවකට පෙර ප්‍රවාහන සේවය අඩාලව තිබිය දී කාර්යාල වේලාවන් සම්බන්ධයෙන් දෙන ලද ඇතැම් වරප්‍රසාද වලින් බොහෝ නිලධාරීන් සහ කනිෂ්ඨ සේවකයන් තව දුරටත් ප්‍රයෝජන ලබන බව පෙනේ.

02. රජයේ සේවකයන් ශ්‍රී ලංකාවෙහි වරප්‍රසාද ලත් පන්තියක් බව අගය කරනු ලැබීම රජයේ අපේක්ෂාවයි. ඔවුන්ට ආරක්ෂිත රැකියා තිබෙන අතර වසරක් පාසා පාසල් හැර යන තරුණ තරුණියන් විශාල සංඛ්‍යාවක් දිවයින පුරා දහස් ගණනින් රැකියා වියුක්තයන්ගේ සංඛ්‍යාවට එක් වෙති. රජයේ සේවකයෝ බොහෝ ප්‍රතිලාභ ලබති. ඒවා අතර සැලකිය යුතු ප්‍රමාණයක නිවාඩු පහසුකම් ද තිබේ. සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දිනයන් මෙන්ම අමතර නිවාඩු ද ගණන් ගත් විට, එක් සේවකයකු සාමාන්‍යයෙන් වර්ෂයක් තුළදී වැඩ කළ යුතු මුළු දින ගණන 202 ක් පමණක් වේ. කනිෂ්ඨ සේවකයන් නොවන රජයේ සේවකයන් පෙ. ව. 8.30 සිට ප. ව. 4.15 දක්වා වැඩ කිරීමට අවශ්‍ය වන අතර, දිවා ආහාරය සඳහා මිනිත්තු 30 ක් ද ලැබෙන හෙයින් එක් දිනකට ක්‍රියාත්මක වශයෙන් තිබෙන වැඩ කරන මුළු පැය ගණන 7 1/4 ක් පමණි. ඊට අමතරව, රජයේ සේවකයන්ට මසකට දෙවරක් පැය 1 1/2 බැගින් වූ කෙටි නිවාඩු වලට ද හිමිකම් තිබේ.

03. වැඩ කරන පැය ගණන සම්බන්ධයෙන් වූ මේ සියළුම වරප්‍රසාද තිබියදීත්, ප්‍රමාද වී පැමිණීමෙන්, වේලාසනින් පිටවී යෑමෙන් හෝ දිවා ආහාරය හා තේ සඳහා වූ විවේක කාලයන් ඉක්මවා ගත කිරීම මඟින් අනවසර නිවාඩු රජයේ සේවකයන් තව දුරටත් ලබා ගත හොත් ඔවුන්ගේ සේවය ලැබිය යුතු මෙරට ජනතාවට ඔවුහු එම සේවය අහිමි කරති. එහෙත්, එසේ අහිමි වන පූර්ණ ප්‍රතිලාභ ලැබිය යුතු එම සේවය සඳහා ඔවුහු සම්පූර්ණ වැටුප් ලබති. ඉහත සඳහන් පරිදි අනවසර නිවාඩු හේතු කොට ගෙන දිනකට පැයක් පමණක් බැගින් වුව ද අහිමි වේ නම්, ඉන් රජයට සිදුවන මුළු අලාභය දිනකට රුපියල් දශලක්ෂ 9.8 ක් හෝ වසරකට රුපියල් දශ ලක්ෂ 1980 ක් බැගින් වන බව සරල ගණන්

බැලීමකින් පෙන්නුම් කෙරේ. ජන සුවිය පවුල් 33000 ක් වසර 24 ක් තුළ නගා සිටුවීම සඳහා ර
වැය කළ යුතු මුදලට එම වාර්ෂිකව පාඩු වන මුදල සමාන වේ.

04. නොමග ගිය සිය දෙනකු විසින් ඇති කරන ලද අවහිරතා වලින් මුළු මහත් ජාතියම ක්‍රම ක්‍රමයෙන් පීඩාවෙන් සිටින මේ අවධියේ ධෛර්යයෙන් යුතුව සේවය කරමින් අපතේ යෑම් සහ දූෂණ තුරන් කොට නිෂ්පාදනයන්හි වඩා ඉහළ මට්ටම් ළඟා කර ගැනීම මූලික වශයෙන්ම තමන්ගේ වගකීම බව රජයේ සේවකයා විසින් සැලකිල්ලට ගත යුතු වීම රජය අපේක්ෂා කරයි.

05. එම නිසා, ආයතන සංග්‍රහයෙහි සඳහන් පරිදි, නිවාඩු (XII පරිච්ඡේදය) කාර්යාලයට පැමිණීම හා කලට වේලාවට පැමිණීම (XXVIII පරිච්ඡේදයේ I වගන්තිය) සහ කාර්ය ධක්ෂතාවන් පිළිබඳ රීති අමාත්‍ය ලේකම්වරුන්, රාජ්‍ය ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තරයේම ක්‍රියාත්මක කළ යුතුය.

අර්. තලේ/ පී. එන්. එම්. ප්‍රනාන්දු
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

(එම්. එන්. ජනයිඩ්)